ආඛ්‍යාන narrations
**Volume 02 | Issue 02 | July – December 2017 | Article 02**
**ISBN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# ශ්‍රී ලාංකේය චිත්‍රකතා නිමැවුම් මඟින් පිළිබිඹු වන තත්කාලීන සමාජය

මනෝරංජන හේරත්[2]

PhD, MFA, BFA

manoranjanaherath@gmail.com

**සංක්ෂිප්තය**

චිත්‍රකතා කලාව මෑත ඉතිහාසය තුළ බිහිව, විශේෂයෙන් 70 දශකයේදී ශ්‍රී ලාංකේය තරුණ ප්‍රජාව අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත්වූ විනෝදාශ්වාදාංගකි. හුදෙක් විදග්ධ කලා හා සාහිත්‍ය විචාරයෙහි චිත්‍ර කලාවට එතරම් ඉඩකඩක් හිමි නොවුණත්, ජනප්‍රිය කලාවක් වශයෙන් ජන සමාජය කෙරෙහි ඒ මගින් කරන ලද බලපෑම අති විශාලය. මේ අනුව මෙම ශාස්ත්‍රීය විවරණය ශ්‍රී ලාංකේය සමාජය තුළ චිත්‍ර කතා කලාව ප්‍රතිෂ්ඨාපනය වූ ආකාරය හා එහි භාවිතාව විග්‍රාහාත්මකව විමර්ශනය කිරීමට දරන ලද උත්සාහයකි.

**ප්‍රමුඛ පද:** ශ්‍රී ලංකා සමාජය, චිත්‍ර කතා කලාව, ජනප්‍රිය සංස්කෘතිය

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය **චිත්‍රකතා** කලාවේ ප්‍රභවය බෞද්ධ සිතුවම් නිර්මාණ ප්‍රකාශනයේ ඇරඹුම දක්වා දිව යන්නකි. ඒවා ගුහා බිත්ති මත ඇඳි රූපාක්ෂර ප්‍රකාශන සාධක දක්වා ඉතිහාසයකට බන්ධුතා දක්වන්නේ යැයි ද තර්ක කළ හැකි ය. එහෙත් "**චිත්‍ර කතා**" ශෛලියට වඩාත් සමීප සාධක අපට සපයනු ලබන්නේ ලාංකේය පැරණි සිතුවම් ඇසුරිනි. පැරණි බෞද්ධ කලාව අතිශය මනහර ලෙස චිත්‍රය මගින් ප්‍රබල ප්‍රකාශන රසක් ඉදිරිපත් කළ මාධ්‍යයකි. එය එතරම්ම විශිෂ්ටත්වයට පත්ව ඇත්තේ හුදු සෞන්දර්යාත්මක රස ජනනය කෙරේ පමණක් නොව ඉතා ගැඹුරු, අර්ථ පූර්ණ ප්‍රකාශන ලෙස රසිකයන් හා ගනුදෙනුවක යෙදුන බැවිණි. එහෙයින් ලාංකේය ආගමික කලාංග තුළ චිත්‍ර (චිත්‍ර මගින් කී කතා) ප්‍රකාශන මාධ්‍යයක් ලෙස ඉතා අගනා සේවයක් කළ බව

[2]ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මූර්ති කලා අධ්‍යයනාංශය, දෘශ්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, කොළඹ.

පෙනී යයි. එය සන්නිවේදන මාධ්‍යයක් ලෙස තත් සමාජීය මනැස් ආමන්ත්‍රණය කළ බැව් පිළිගත යුතු වේ. මෙහිදී ප්‍රධාන වශයෙන් බෞද්ධ ආගමේ දාර්ශනික පසුබිම විග්‍රහ කෙරෙන කතාවස්තු පොදු ජනයා වෙත ඉතා සරලව තේරුම් යන අයුරින් චිත්‍රමය රූපාවලි ලෙස ගෙනහැර දැක්වීම අපට කැපී පෙනෙයි. මෙලෙස බුද්ධ දර්ශනය හා බුද්ධ චරිතය පිළිබඳ වන විග්‍රහයන් චිත්‍රය මගින් පැහැදිලි කරනු ලැබුයේ එකල පැවති අනෙකුත් බණ දේශනා හෝ ග්‍රන්ථ කියැවීම්වලට අමතර වශයෙනි. මෙහිදී රූපමය ප්‍රකාශන අන්තර්ගත චිත්‍ර මගින් කී කතන්දර එම සමාජයට සුවිශේෂ මෙහෙයක් කළබැව් අපට පැහැදිළිය. එය අනිවාර්යයෙන්ම සමාජය හා ගනුදෙනු කළ බැව් සිතිය හැකිය. මෙම රූප මගින් කතන්දර කී චිත්‍රකතාව පැරණි සමාජයේ සිට මේ දක්වා ම ඉතා විශේෂ කාර්යභාරයක් සිදුකරන බැව් පෙන්වා දිය හැකි ය.

බෞද්ධ හා හින්දු ආගමික සංකල්ප හා එම විශ්වාස හා බැඳී පැවති විවිධ ප්‍රකාශන පමණක් නොව ලෞකික දිවිය හා සබැඳි සිද්ධීන් ද පැරණි චිත්‍රය මගින් ප්‍රකාශ විය. එය යුග යුග පසු කරමින් මේ වන විට ගමන් කොට තිබේ. එම පසු කළ අවධිවල වූ සමාජ ආර්ථික, සංස්කෘතික හා දේශපාලන වටපිටාවට හා එම හැසිරීම්වලට ද අනුකූල වෙමින් චිත්‍රයේ භාවිතය ද වෙනස් වෙමින් විවිධ ස්වරූප ගනිමින් අඛණ්ඩ ව ගමන් කොට ඇත. එම ප්‍රකාශන ඒ ඒ කාලපරිච්ඡේදයන්හි සමාජ පසුබිමේ පිළිබිඹුවන් සේ පෙනී සිටියි.

සැබැවින්ම "**චිත්‍රකතා**" යනු මොනවා ද? කවරක් ද? යන්න අප හඳුනාගත යුතු වේ. පූර්ව පැහැදිලි කළ අපගේ ආගමික කලාවේ සංකල්ප සහිත ජාතකකතා ආදිය චිත්‍ර ආශ්‍රයෙන් කතා කීමේ ආරම්භය ලෙස හැඳින්විය හැකි ය. එනම් කිසියම් කතාවක් රූප ආශ්‍රයෙන් විස්තර කිරීම යි. මේ සඳහා හොඳ ම පුරාණ නිදසුන් අපට දැනට ශේෂව පවත්නා පොළොන්නරු තිවංක පිළිම ගේ චිත්‍ර ඇසුරින් පෙන්වා දිය හැකි ය. ඒවා 12 වන සියවසට අයත් ය. ඊට පූර්ව සිටම ලාංකේය සිතුවම් භාෂාව මගින් කතා කීමේ ක්‍රමවේද අනුගමනය කළ බවට අපට අනුමාන කළ හැකි ය. ක්‍රි.ව 5-7 සියවස් කාලයට අයත් යැයි සැලකෙන හිඳගල සිතුවම් මගින් කියැවෙන ප්‍රකාශනය පවා සැලකීමේ දී අප යම් සිද්ධි දාමයක් චිත්‍ර අසුරින් කියැපෑමේ ක්‍රමවේද බොහෝ ඈත කාලයක සිට අනුගමනය කළ බැව් පෙනේ.

බුදුන්වහන්සේ තව්තිසා දෙව් ලොව දී තම මෑණියන් වහන්සේට දහම් දෙසීමත්,උන්වහන්සේ තපස්සු භල්ලුක යන වෙළඳුන්ගෙන් දානය පිළිගැනීමත් නිරූපිත හිඳගල ලෙන් සිතුවම් කඳිම චිත්‍රමය සංකල්පනාවක් ගොඩනංවා ඇත. මෙවැනි විවිධ සිද්ධි නිරූපිත චිත්‍ර සාධක අපට පැරණි ලෙන් චිත්‍ර , පැතිකඩ චිත්‍ර, දාගැබ් අභ්‍යන්තර සිතුවම්, වාහල්කඩ නිර්මාණ හා ගොඩනැගිලි ආශ්‍රයෙන් හමුවේ. එහෙත් ඒවායේ මුල් ස්වරූපය අද ශේෂව නොමැත. එහෙයින් ඉතා පැහැදිලි සාධක සහිත ව චිත්‍ර කතා කලාවේ තොරතුරු ක්‍රමවේද අපට විමසීම අසීරු ය. එනමුත් ආගමික හා සාහිත්‍ය වීමංසන දැනුමින් පොහොසත් අපගේ පැරණි ජනසමාජය තුළ "චිත්‍රය" නමැති මාධ්‍යය ද ප්‍රබලස්ථානයක වූ බවට සාධක නැත. අනිවාර්ය ලෙසම එම කාලීන ජනයාගේ සිතැගියාවන් හා එම සමාජ සංස්කෘතියේ හැඩය හා ආශාව එම චිත්‍ර සටහන් මත අන්තර්ගත වූවාට සැක නැත. මෙහි දී පැරණි ආගමික චිත්‍රයේ භාවිතය සම්බන්ධයෙන් අපට පසුකාලීන ව ද තොරතුරු හමුවන බැව් අමතක නොකළ යුතු ය. විශේෂයෙන් ම මහනුවර යුගයේ සිට නූතන යුගය දක්වා ඉදිකළ බොහෝ බෞද්ධ

විහාර 'සිතුවම් ගෙවල්' තුළ විවිධ වූ චිත්‍රමය රූපාවලි රැසක් අපට හමුවේ. ඒවා විවිධ ශෛලීන්වලින් යුක්තව, බොහෝ දුරට පොදු තේමා විෂය කොටගනිමින් ප්‍රකාශනයේ යෙදී සිටියි. මෙම රචනාවේ මූලික විමර්ශනය හා අධ්‍යයනයට බඳුන් වනුයේ 1950 න් පසු ඇරඹි නවමු සන්නිවේදන මාධ්‍යයක් වන බැවින් ඉතා දීර්ඝ ව ඒ දක්වා ගමන්ගත් ලාංකේය චිත්‍රකතා කලාව පිළිබඳ සාකච්ඡා නොකෙරේ. එහෙත් ඒ දක්වා (1950) බිහි වූ බොහෝ සිතුවම් හා ඒවාට පාදක වූ වස්තු බීජයන් ඇසුරින් පවා අපගේ ප්‍රශ්තුත විෂය පථයේ යම් විෂය කරුණු සාකච්ඡාවට බඳුන් කිරීමේ ඉඩ ප්‍රස්ථා හිමි වේ.

### නූතන සිංහල චිත්‍ර කතාව

බටහිර පුවත්පත් ඇසුරින් චිත්‍ර කතා මාධ්‍යයේ උරුමයෙන් දේශීය චිත්‍රකතා සම්ප්‍රදාය වර්ධනය වූ බව වර්ණසූරිය මහතා පෙන්වා දෙයි (වර්ණසූරිය, 1993: 2). අපට පුරාණ චිත්‍රකතා සම්ප්‍රදායක් තිබූ මුත් නූතන සිංහල චිත්‍රකතාව ඇරඹෙන්නේ බටහිර චිත්‍රකතාව ආදර්ශයට ගනිමින් බව ආරියරත්න මහතා පවසයි (ආරියරත්න, 2007, 25 පිටුව). ශ්‍රී ලාංකේය නූතන චිත්‍රකතා කලාවේ ඇරඹුම ප්‍රධාන වශයෙන්ම බටහිර මාධ්‍යයන්ගේ එක් මුහුණුවරක ආභාසය ලත් බව පෙනී යන අතර එහිදී අපගේ පැරණි කලාවේ කතන්දර කීමේ (චිත්‍ර මගින්) ක්‍රමවේදයට සම්පූර්ණ වෙනස් බව සත්‍යයකි. චිත්‍රකතා මාධ්‍ය සන්නිවේදන ප්‍රකාශන ලෙස කලඑළි බසින්නේ විවිධ තාක්ෂණික ජයග්‍රහණ ලද ලෝකයත් තුළ වීමත් නොයෙක් සමාජ සංස්කෘතික හා ආර්ථික වටපිටාවක් ක්‍රියාත්මක ලෝකයක වීමත් ඊට හේතුවයි. එහෙයින් අපගේ චිත්‍රකතා කලාව ශ්‍රී ලාංකේය ඓතිහාසික කලාවේ දිගුවක් ලෙස ගැනීමේ හැකියාවක් නොමැත. නූතන චිත්‍ර කතාවේ ආකෘතිය වස්තුවිෂය හා අරමුණු සම්පූර්ණයෙන් ම පෙනී සිටින්නනේ නූතන සමාජ අවකාශයේ ක්‍රියාකාරීත්වයට අනුකූල ව ය. එම සමාජ සිතැඟි හා අවශ්‍යතාවන් හා සබැඳි ව ය. මුද්‍රිත මාධ්‍යයක් ලෙස තාක්ෂණයේ ද සහය ඇතිව එළිදකින චිත්‍රකතාව අප වෙත එකතු වන්නේ තවත් එක් සන්නිවේදන ක්‍රමයක් ලෙසිනි.

19 වන සියවසේ අගභාගයේ දී මෙම මාධ්‍ය බටහිර ප්‍රභවය වීමේ දී අධිවිවේචනාත්මක චිත්‍ර සම්ප්‍රදායක් (Caricature) හා විකට චිත්‍ර (Cartoon) ඔස්සේ ඇරඹෙන බැව් පෙන්වා දී තිබේ. (වර්ණසූරිය, 1993, 14 පිටුව.) මෙම චිත්‍රකතා මාධ්‍ය හාස්‍යජනක තීරු (චිත්‍ර) කතා (Comic Strip, Strip Cartoons) ලෙස ඉංග්‍රීසි භාෂාවෙන් හඳුන්වන අතර ඒවා චිත්‍රකතා පොත් (Comic Books) ලෙස ද ප්‍රකාශයට පත් කෙරේ. එහි ආරම්භයේ සිට නූතනය දක්වා වන ගමන් මග තුළ චිත්‍රකතාව විවිධ තේමාවන්, ශෛලීන්, අරමුණු හා අපේක්ෂා පෙරදැරිකොට ගනිමින් විකාශනය වෙමින් පවතී.




1951 දී ප්‍රථම සිංහල චිත්‍රකතාව ලංකාදීප පුවතෙහි පළවිය. එය ජී.ඇස්. ප්‍රනාන්දු විසින් අඳින ලද "නීලා" නම් සිතුවම් කතාව ලෙස සැලකේ. එකල බටහිර චිත්‍ර කතා අතර ජනප්‍රිය වූ "**ටාර්සන්**" කතාවේ ආකෘතිය ඔස්සේ මෙය රචනා වී ඇත. ඒ අනුව පැහැදිලි වනුයේ බටහිර චිත්‍ර කතාවේ ආභාසය අනිවාර්ය ලෙසම අපගේ චිත්‍රකතා ප්‍රභවය වීම කෙරේ බලපා ඇති බව ය. මෙම චිත්‍ර කතාව "නීල කුමාර" ලෙස දෙවන කොටසක් ලෙසින් පාඨකයන් අතරට පත්වීමෙන් පෙනී යන්නේ එම කතා කෙරෙහි රසියකයන්ගේ අකාර්ශනය ලැබූ බවය. මෙලෙස සිංහල භාෂාව කියවන පාඨක සමූහයා වෙත "චිත්‍රකතා" එක්වීම විශේෂත්වයක් ගන්නා කරුණකි. එය 1950-60 වැනි සමාජ වටපිටාවක් තුළ හිඳිමින් අප විමසිය යුතු වේ. යුරෝපීය පාලනයෙන් මිදී නිදහස් රටක් ලෙස සමාජය හැඩගැහෙමින් පවතින මොහොතක පුවත්පත් මගින් බටහිර ආරගත් චිත්‍ර කතා එක් වීම නවමු අත්දැකීමක් වන්නට ඇත. චිත්‍රවල වූ විවිධත්වය මෙන්ම චිත්‍ර කතා මගින් ගෙන ආ විවිධ තේමා රැගත් කතා ද සිංහල චිත්‍රකතාව වඩාත් ජනප්‍රිය වීම කෙරෙහි බලපාන්නට ඇත.

ශ්‍රී ලාංකේය චිත්‍ර කතාවේ විකාසනය තෙවැදෑරුම් ව සිදුවූ බැව් වර්ණසූරිය පෙන්වා දෙයි. (එහිම 25 පිටුව. ) ඒවානම්,

අ. පුවත් පත්හි පළ වූ චිත්‍ර කතා

ආ. චිත්‍ර කතා පොත්

ඇ. චිත්‍ර කතා සඳහා ම වෙන්වූ පුවත්පත් (1972න් පසු)

ඊට අමතරව අද දවස (2016) වන විට අන්තර්ජාලය තුළ ක්‍රියාත්මක විවිධ වෙබ් අඩවි මගින් චිත්‍ර කතා ඉදිරිපත් කිරීමේ ක්‍රමවේද දක්වා එය විකාසනය වී ඇත.

චිත්‍රකතා, චිත්‍රකතා පත්තර, වචන රහිත චිත්‍රකතා, සජීවිකරන කාටූන් ආදී වර්ග යටතේ චිත්‍රකතා කලාව භාවිතයට ගැනෙන අතර විශේෂ සාහිත්‍යාංගයක් ලෙස සමාජගත වූ ක්ෂේත්‍රයක් ලෙස හැඳින්විය හැකි ය.

මෙම සියලු වර්ගයේ චිත්‍ර කතාවන්හි පහත ආකාරයේ අංශයන් නියෝජනය කරමින් ඒවායේ සැකසුම සංවිධානය වී ඇති බැව් අපට හඳුනාගත හැකි වේ.

අ - ප්‍රේම කතා

ආ - ඓතිහාසික වීර කතා

ඇ - විවිධ සටන් හා රහස් පරීක්ෂක කතා

ඈ - අසාමාන්‍ය ශක්තියෙන් හෙබි වීරයන්ගේ කතා

ඉ - ජන ජීවිතය හා නාගරික සමාජය පිළිබඳ කියැවෙන කතා

ඊ - ජාතක කතා

උ - පැරණි සාහිත්‍යයෙන් තෝරාගත් විවිධ කතා

ඌ - අද්භූත කතා

එ - හාස්‍ය උත්පාදන කතා හා දේශපාලන විකට කතා

ඒ - ළමා කතා

ඔ - මනඃකල්පිත වෙනත් කතා

මේ ආකාරයේ විවිධ තේමා ඔස්සේ නොයෙක් කතා රාශියක් අප වෙත චිත්‍රකතා පුවත්පත් තිළිණ කොට ඇත. එවන් චිත්‍රකතා සංකලනයන්ගෙන් විවිධ රස මැවූ චිත්‍රකතා කලාව ඉතා ඉහළ ම තලයට පත්වන්නේ, පාඨක අවධානය උපරිම ලබාගන්නේ චිත්‍ර කතා පත්තර ලෙස බිහිවීමත් සමග බව විවිධ විචාර විමසීමේ දී අපට පෙනී යයි. එලෙස චිත්‍රකතා පුවත් ලෙස එළිදැක්වීම වෙනම ම පාඨක සමාජයක් ගොඩනැංවීම කෙරෙහිත්, එසේම සාහිත්‍ය ධාරාවේ තවත් එක් විශේෂ අංගයක් ප්‍රභවය වීම කෙරෙහිත් බලපා ඇත. එය ලාංකේය දෘශ්‍ය කලා ක්ෂේත්‍රය තුළ තවත් එක් වූල සම්ප්‍රදායක සංවිධානත්මක බිහිවීමක් ලෙස ද හැඳින්විය හැකි ය. එසේ ම නවමු සන්නිවේදන මාධ්‍යයක් ලෙස හැඳින්වීමේ හැකියාව ද ඇත. 70-80 දශකයන්හි **සුන්දර කලාවක්** ලෙස මෙම චිත්‍ර කතාව වඩාත් විශේෂත්වයට පත්වීම කෙරේ උක්ත කරුණු බලපාන්නට ඇත. බොහෝ ජන ස්ථරයන්හි මෙම කලාව අතිශය ජනාදරයට පත්වීම මගින් පෙනී යන්නේ එය එම අවධිය තුළ මහත් අවධානයට පාත්‍ර වූ බවයි. ඒ අනුව ලාංකේය සාහිත්‍ය ධාරාවේ ඉතා වැදගත් සංධිස්ථානයක් චිත්‍ර කතා පුවත් මගින් සනිටුහන් කොට ඇති බව අපගේ අදහස ය.

පූර්ව පෙන්වා දුන් චිත්‍රකාතවේ සැකැස්ම හා සංයුතිය දෙස බැලීමේදී එම පුවත් පත් මගින් ඒවා කියවන බලන පාඨකයාහට එකම මෙහොතක් තුළ දී විවිධ රස රැසක් ලබා දීමට චිත්‍ර කතා පත්තර වලට හැකි විය. එකම පත්තරයක් මගින් මෙලෙස විවිධ අත්දැකීම් රසිකයා වෙත ලබාදීම හුදු වෙළඳ උපක්‍රමයක් ලෙස අර්ථගැන්වීමට වඩා තත් සමාජ සිතුම් පැතුම් අරභයා ගොඩනංවන ලද හා එවක සමාජය ඉල්ලා සිටි අර්ථ රස වින්දන උදෙසා චිත්‍රකතා ශිල්පීන් හා සම්පාදකයන් විසින් ඉතා දූනුවත්ව කරනු ලැබූ සංස්කරණයක ප්‍රතිඵලයක් ලෙස පෙන්වා දිය හැකි ය. සමාජයේ විවිධ වයස් කාණ්ඩ බුද්ධි මට්ටම් හා රස වින්දන මට්ටම් මෙන්ම විවිධ සමාජ ස්ථරයන් ආමන්ත්‍රණය කිරීමේ

හැකියාව මෙම චිත්‍රකතා සංයුතිය තුළ විධිමත්ව අන්තර්ගතව තිබීම මගින් එය මනාව පැහැදිලි වේ. බටහිර චිත්‍ර කතාවේ අභාසය ලාංකේය චිත්‍රකතා සිත්තරු තම රසික සමාජයට උචිත ලෙස ගලපා ගැනීමට ගත් උත්සාහය කෙතෙක් ද යන්න ඒ පිළිබඳ වඩාත් විමසිලිමත්ව අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි වේ.

**චිත්‍ර කතාවේ ජනප්‍රියත්වය**

මෙම මාධ්‍ය ජනප්‍රිය වීම කෙරෙහි බලපෑ ප්‍රධාන කරුණු ගණනාවක් ඇති බව පෙනී යයි. විවිධ චිත්‍රකතාවන්ගේ කතා රචනාවල වූ විවිධත්වය හා චිත්‍ර ශෛලීන්ගේ වූ වෙනස්කම් ද ඊට බලපෑවේ ය. සතියෙන් සතියට නිකුත් වූ මෙම පුවත්පත්වල වූ කතා කියවීමට හා බැලීමට රොද බැඳගත් රසික සමාජ මහත් නොඉවසිල්ලෙන් යුතුව එහි ඊළඟ කලාපය එන තුරු බලා සිටි තත්ත්වයන් ද විය. කතා රචකයන් කුතුහලය දනවන අයුරින් සිය කතා ඉදිරිපත් කරනු ලැබීය. එසේ ම එකවර එකම පුවත්පතක් මගින් කතා 15-19 අතර ප්‍රමාණයක් විවිධ වින්දන කෝණ ඔස්සේ බැලීමේ හැකියාව පොදුවේ චිත්‍රකතා කියවූ රසිකයාට හිමිවීමද එහි ජනප්‍රිය බව ඉහළට දැමීමට හේතු විය. ඉතා වර්ණවත් රූප රාමු මගින් චිත්‍රකතා ඉදිරිපත් වීමත් ආකර්ශනීය වර්ණ මුල්පිටුවලින් ඒවා හැඩවීමත් රසික අවධානය කෙරේ හේතු වූවකි. එසේ ම අඩු මිලකට මෙම පත්තර මිල දී ගැනිමේ වූ හැකියාව, බොහෝ අය අතරේ හුවමාරු කොටගෙන කියවීමට තිබූ වැඩි ඉඩකඩ , පොදුවේ එක්ව රසවිඳීමේ අවස්ථාව හා නැවත නැවත එම කතා රූපරාමු ඇසුරින් ද බලා රසවිඳීමේ ලා තිබූ අවකාශය ආදිය ජනප්‍රියත්වය කෙරේ බලපෑ හේතු සාධක අතර වේ.

මෙමගින් ඉදිරිපත් වූ චිත්‍රතුළ වූ ප්‍රකාශන ගුණ පාඨක සිත් අමන්දානන්දයට පත් කරන ලදි. චිත්‍ර කතාංගවල වූ දෘශ්‍ය අක්ෂර මගින් එලෙස ඇති කළ උපරිම රූප ප්‍රකාශන අගය ඒ කෙරෙහි වැඩි අවධානයක් ගැනීමෙ හි ලා බලපෑ බව ද පෙනේ. එම කතාංග අතර වූ අතැම් චරිත තරුණ පෙම්වතුන්ගේ අත්මය කොටගත් පරමාදර්ශ විය. (උදාඃ- ඉතිං ඊට පස්සේ චිත්‍ර කතාවේ - කැලුම් - දේදුනු චරිත) යුනිකෝ, ටෝගා වැනි චිත්‍රකතා නව යොවුන් තරුණයන්ගේ ජීවිතවල වීරත්වය මතු කළ චරිත විය. ප්‍රේමයේ සොඳුරු බව මෙන්ම විරහ වේදනාවේ ඇත්දැකීම් ලත් තාරුණ්‍යයට මේවායේ වූ ඇතැම් කතා අතිශය ලන්විය. එසේ ම මේ අතර වූ අසාධාරණයට එරෙහිව නැගී ආ යුක්තිය පසිඳලීමට මුල්වූ වීරයන් පිළිබඳ වූ කතා ද ඒවාට ප්‍රිය කළ හා එම පීඩනයට හසුවූ සමාජ පංතිවල පාඨකයන් මහත් අභිරුචියෙන් වැළඳ ගත්හ.




එසේම, ශෘංගාරය අවුස්සන සුළු කතාංග මෙන්ම ආකර්ෂණීය පිටකවර හා රූප ද චිත්‍ර කතා තුළ අන්තර්ගත වීම ඒවා ජනප්‍රිය වීමට හා ජනප්‍රිය කරවීමට හේතු වූ බව සිතිය හැකි ය. තවද මෙම පුවත් පත් මගින් වෙසක් පොසොන් නත්තල් හා අවුරුදු උත්සව කාලවල දී ඒ ආශ්‍රිත චිත්‍ර තිළිණ ලෙස ලබාදීම ද, තම කලාප සමගින් නව වසර උදාවෙන්ම දින දසුන් පිරිනැමීම ද, විවිධ තරඟ පැවැත්වීම, ත්‍යාග ලබාදීම හා මිතුරු සමාජ එම පුවත් ආශ්‍රයෙන් අරඹා පවත්වාගෙන යෑම ද ඒවා ජනප්‍රිය කරවීම සඳහා යෙදූ උපක්‍රම ලෙස පෙනී යයි.

**චිත්‍ර කතාව, සමාජ සිතුම් පැතුම් නියෝජනය කළ බැව් විමසීමේ ආශ්‍රේයක් ලෙස**

මෙතෙක් අප විසින් සැකෙවින් ශ්‍රී ලාංකේය චිත්‍ර කතාවේ මූලාරම්භයත් එහි සැකසුමත් එය ජනාදරයට පත්වීම කෙරේ වූ බලපෑ කරුණුත් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව කාලීන සමාජ අවශ්‍යතාවක් ලෙස එය ජනාදරයට පත්ව ජනගත වූ බව හැඳිනගත හැකි විණි. එලෙස සමාජය වෙතට ප්‍රවිශ්ට ව පරිශීලනය වූ මෙම කලාංගය තත්කාලීන සමාජයේ සිතුම් පැතුම් කවර ආකාරයකින් පිළිබිඹු කරන්නේ දැයි යන්න අප විසින් මින් ඉදිරියට විමර්ශනය කරනු ලැබේ.

අපගේ ප්‍රස්තුතයට අදාළ ව අප විසින් පූර්ව කරන ලද විමර්ශනය මගින් මෙම චිත්‍රකතා කිසියම් ව්‍යුහයක්/සැකැස්මක් තුළ සංවිධානගත ව අති බව පෙන්වා දෙන්ට යෙදුණි. ඒ අනුව විවිධ

කතාංග මූලික වශයෙන් සැකසීමේ දී සමාජ වයස් කාණ්ඩ ඉලක්ක කොට ඇති බැව් ද පැහැදිලි කෙරිණි. එම සැකැස්ම බටහිර චිත්‍රකතා ආභාසය මත සිදුවූවක් ලෙස කෙනෙකුට තර්ක කළ හැකි ය. එහෙත් ලාංකේය චිත්‍ර කතාව ක්‍රමයෙන් විකාසනය වීමේ දී දේශීය ආරක් ගනිමින් ලාංකේය පාඨක අවශ්‍යතා මත සැලසුම් වන බව නිරීක්ෂණය කළ හැකි ය. ත්‍රාසය, කුතුහලය පිරි වීරකතා, අතර මුල දී චිත්‍ර කතා වල වූ මේස, වනගත කොල්ලා, පණ්ඩුකාභය, සිංහබාහු, ලන්දේසිහටන, ශ්‍රී වික්‍රම ආදී කතාංග ඉතා පැහැදිලි ලෙසම ලාංකේය සිංහල බොදු පාඨකයා ඉලක්ක කොට ගනිමින් නිර්මාණය වූ කතාන්දරය. ඒ අනුව මෙම වකවානුව තුළ වූ අනෙකුත් සාහිත්‍ය කලා ධාරාවන්ට සාපේක්ෂ ව මේවා මගින් ද පොදු ජන අවශ්‍යතා සලකා බැලූ බව පෙනේ. මෙම කතා චිත්‍ර කතා ආරම්භයේම පුවත්පත් සඳහා එක් වූ ඒවාය. ඒ අනුව අප විසින් එම සමාජ සංස්කෘතියේ ජන අපේක්ෂා පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය. 50-60 දශක තුළ බටහිර පන්නයේ "ටාසන්" ආකාරයේ වනගත වීරයන් ලෙස එක්වන "මේස" චිත්‍ර කතාව එම සමාජයේ පිරිස් අභිරුචියෙන් යුතුව කියවූ බව පෙනේ. තව ද ඉන් නොනැවතී ලාංකේය ඉතිහාසය හා බැඳි වීර චරිත පිළිබඳ කතා චිත්‍රකතා අනුසාරයෙන් ඉදිරිපත් වීම එම සාමජය එවන් වූ කතා කියවීමට දැක්වූ කැමැත්ත මොනවට කියා පායි. ජාතිය පිළිබඳ ආලය හා දේශප්‍රේමීත්වය, සාරධර්ම හා යහපත් සමාජ අපේක්ෂා එකල වූ නවකතා, ගීත , කවි ආදී නිර්මාණාංගයන් හි ද අන්තර්ගත වූ අතර චිත්‍ර කතා මගින්ද එය විශේෂයක් ලෙස ඉදිරිපත් වන්නේ එකල පොදු ජන සිතුම් පැතුම් පිළිබඳ ප්‍රකාශනයක් ලෙසිනැයි අපට තර්ක කළ හැකි ය.

**සමාජ සිතුම් පැතුම් නිරූපණය**

70 - 80 දශක අප සමාජය විවිධ වෙනස්කම්වලට බඳුන් වූ කාල පරාසයකි. නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය හා ඉන් වෙනස් වන ආර්ථික සමාජ පරිභෝජන රටාවට සමපාත ව ජන සිතුම් පැතුම් ද වෙනස් විය (චිත්‍ර කතා පුවත්පත් ප්‍රවේශය ද එහි ම කොටසක් ලෙස දැක්විය හැකි ය). ප්‍රේමයේ සුන්දරත්වය අපේක්ෂා කළ යෞවනය ද සිය පීඩිත ජීවන රටාවෙන් ගැලවීමට යත්න දරූ සමාජය ද නව සමාජ පෙරළියකට එක්වූ හා එය අපේක්ෂා කළ නව මතධාරී යෞවනය ද නව අර්ථ රටාව තුළ නව මානයන් සෙවූ සමාජය ද, මේ සියලු දෑ හමුවේ අපේක්ෂාභංගත්වයට පත්වූ පුද්ගල චරිත ද 70 - 90 දශක කාල පරාසය තුළ අපට හමුවේ. ඒ සියල්ලේ ප්‍රතිබිඹුවන් ඉතා පැහැදිලි ලෙසම චිත්‍ර කතාව හා අන්තර්ගත විය. නොමැති නම් චිත්‍රකතාව ග්‍රහණය කොට ගත්තේ හා ඉන් ප්‍රකාශනය වූ එම පසුබිම යි.




සරත්මධු විසින් අඳින ලද දේදුනු -කැලුම් පෙම් යුවල පෙනී සිටි 'ඉතිං ඊට පස්සේ' චිත්‍රකතාව (1975 - සිත්තර) එම කාලයේ අතිශය ජනප්‍රිය විය. ප්‍රේමයේ උන්මාදය හා සොඳුරු ස්වප්න අපේක්ෂා කළ නිදහස් යෞවනය ඉන් කුල්මත් විය. එය ඔවුනගේ පරමාදර්ශ විය. එසේනම් මෙතුළින් එම සමාජයේ තරුණ, ගැටවර ප්‍රේමනීය ලෝකය පිළිබිඹු නොවන්නේ ද? එම යුගය අද මෙන් කෙටි පණිවිඩ දුරකතන සංවාද, වීඩියෝ සංවාද ආදී සජීවී පණිවිඩ හුවමාරු ක්‍රම මගින් ප්‍රේමනීය අදහස් හුවමාරු වූ නිදහස් වටපිටාවකින් සමන්විත නොවීය. එම යුගයේ ප්‍රේමය පෙම් හසුන් මත ලියැවුන සාහිත්‍යයකි. එය ගමේ පන්සලේ සල්පිලේ දී තම ප්‍රියම්බිකාව හමුවේ පුයර පෙට්ටියට, සබන් කැටයකට, ලේන්සුවකට, කොට්ට උරයකට , සුවඳ විලවුන් බෝතලයකට ඉහළ ම ලන්සු කැඳවූ යුගයකි. ප්‍රේමයේ සංකේත ලෙස ඒවා පෙම්වතුන්ගේ සිහින කැඳවූ හා එම හැඟුම් ආස්වාදනය කළ යුගයකි. සරත් මධුගේ සිතුවම් පෙම්වතුන් අතර පමණක් නොව පාසල් ළමුන්ගේ පෙළ පොත් පිට කවර අතරට ද, සමරු පොත් අතරට ද එක් විය. එසේම චිත්‍රය නමැති මාධ්‍ය සාමාන්‍ය ජනයා අතර රස වින්දන මාධ්‍යක් ලෙස ප්‍රචාරණය වීම කෙරෙහි ද එය බලපෑවේ ය. එකල බාබර් සාප්පු, හෝටල්, බස් රථ ශරීර, දින දසුන්, ගේට්ටු, සමරු පොත්, සාප්පු බෑග් ආදී විවිධාංග තුළට එම චිත්‍ර එකතු විය. සරත්මධු ආදි චිත්‍ර ශිල්පීන් විසින් අඳින ලද චිත්‍ර අනුකරණය කළ පිරිසක් ද විය. ඒ අනුව ඉතා සිත්ගන්නා සුළු සිතුවම් රසවිඳීමේ හා ඒවා ඇගයීමේ ජන පරිසකගේ සිතැඟියාවන් ද මේ චිත්‍ර තුලින් පිළිබිඹු වේ යැයි අපට යෝජනා කළ හැකි ය.

මෙම චිත්‍ර කතාවන්ගේ සිතුවම් හා කතා ඉතා බොළඳ හා ආධුනික මට්ටටමේ ගුණයන් සහිත ව ඉදිරිපත් වූ අවස්ථා ඇතිමුත් පොදුවේ මෙම නිමැවුම් ඉතා පහත් කලාංගයක් ලෙස හැඳින්වීම එම ක්ෂේත්‍රයේ දායකත්වය පිළිබඳ ව සමබර විමර්ශනකින් තොරව කෙරෙන විචාර ලෙස අප පෙන්වා දිය යුතු ය. මෙම චිත්‍ර ඉහළ ශාස්ත්‍රීය මට්ටමේ චිත්‍රවලින් යුතු නොවුව ද, ඒ මගින් ශිල්පීය වශයෙන් දක්වනු ලබන ප්‍රතිභාවන් හා උසස් සංරචන විධි ක්‍රම ද අන්තර්ගත වන්නේ ය. වත්මන් වැඩිහිටි බොහෝ පිරිස් අතර එකල මෙම මාධ්‍යය හා සම්බන්ධ වූ පිරිස් ද ඊට ප්‍රිය කළ පිරිස්ද වෙත්. ඔවුන් බෙහෝ පිරිසකගේ සිත් තුළ කලාත්මක පරිකල්පනයන් ගොඩනැංවීම කෙරෙහි මෙම චිත්‍රකතා පුවත්පත් හේතු වී ඇති බව ඒ පිළිබඳ අද දවසේ කෙරෙන අදහස් දැක්වීම් මගින් පෙනී යයි (බලන්න- සිංහල චිත්‍රකතා සිලෝන් කොමික්ස් Face Book පිටුව). චිත්‍රකතා ක්ෂේත්‍රයේ නියැලෙන ශිල්පීන් දෙසීයකට වැඩි පිරිසක් අපට අද දවසේ හැඳිනගත හැකි අතර සමස්තයක් ලෙස මේ සැම දෙනාම දෘශ්‍ය කලා ක්ෂේත්‍රය තුළ ඉතා වැදගත් කාර්යභාරයක් කළ හා ඊට දායක වන පිරිස් ය. විවිධ නිර්මාණ උත්තේජනයන් සැපයීමෙහිලා ඔවුන් විසින් දැක්වූ දායකත්වය විශාල ය.

**චිත්‍ර කතා පුවත් හා චිත්‍ර කලා ප්‍රබෝධය**

චිත්‍ර විෂයක් නොමැතිනම් කලා ධාරාවක් ලෙස ගත් විට එවකට මෙම විෂය හැදෑරීමේ ආයතන වූයේ ඉතා අල්ප ප්‍රමාණයකි (රජයේ කලා ආයතනය හෝ වෙනත් පෞද්ගලික කලා ආයතන පමණි). ඒ සියල්ල වෙත වුත් එය විෂයක් ලෙස ප්‍රගුණ කිරීමේ ඉඩ ප්‍රස්ථා ඊට කැමැත්ත දැක්වූ බහුතරයකට නොලැබුණි. (එය වත්මනයේ පවා අත්දකින සත්‍යයකි.) චිත්‍ර කතා පුවත්පත් බිහිවීම එක්තරා ලෙසකින් මෙම පිරිස් වෙත එම විෂය පිළිබඳ යම් ධනාත්මක ප්‍රවේශයක් ලබාදුන් බව අපගේ අදහස යි. චිත්‍ර භාෂාව පිළිබඳ යම් හැදෑරීම් සහිත ශිල්පීන් ද මෙම චිත්‍ර කතා නිර්මාණකරණයේ යෙදුන අතර, (උදා - බන්දුධල හරිශ්චන්ද්‍ර) ඔවුනගේ නිර්මාණ සැබෑ ලෙසම මෙම "චිත්‍රය" හැදෑරීමේ උවමනාව දැක් වූ පිරිස් කෙරෙහි යම් බලපෑමෙක් කරන ලදී. මේ පිරිස ද කිසියම් ලෙසකින් චිත්‍ර කතා කියවීම බැලීම හා අධ්‍යයනය යන කාර්යයන්හි නියැළුණහ. ඉන් පෙනී යන්නේ තත් වකවානු තුළ චිත්‍ර කලාව ප්‍රගුණ කිරීමේ උනන්දුව දැක්වූ පිරිසක් ද (චිත්‍ර කතා ඇඳි ශිල්පීන් ද ඇතුළු ව) සිටි බව ය. එසේනම් මෙම මාධ්‍යයේ හැසිරීම හා එහි භාවිතය එම සමාජයේ චිත්‍ර කලාවට උනන්දුව දැක්වූවන්ගේ පරමාර්ථ හා අපේක්ෂා ද ප්‍රකාශ කරනු ලබයි. විවිධ වෙළඳ ප්‍රචාරක මාධ්‍යය, (චිත්‍රපට දැන්වීම්) වාහනවල අකුරු ලිවීම, විවිධ ගෘහ අභ්‍යන්තර සිතුවම් ඇඳීම මෙන්ව චිත්‍ර පාසල් ගුරුවරු කෙරෙහි ද චිත්‍ර කතා පුවත් පත් චිත්‍රය සමීප වීමක් දක්නට ලැබේ. ප්‍රධාන ශාස්ත්‍රීය චිත්‍ර කලා අධ්‍යාපනයෙන් පරිබාහිරි ව ඊට උනන්දුව දැක්වූවන් සඳහා යම් අනුග්‍රාහයකත්වයක් චිත්‍ර කතා පුවත් ප්‍රවේශය බලපෑමක් කරන ලදී.




**තාරුණ්‍යයේ වීරයාගේ පරමාදර්ශය**

චිත්‍රකතා පුවත් අතර අද්භූත හා වීර රසය මතුකළ කතා විශාල සංඛ්‍යාවක් වේ. චිත්‍ර කතාවේ ඉතිහාසය තුළ හමුවන කතා කිහිපයක් මෙසේ නම් කළ හැකි ය.

අනුර විජේවර්ධනගේ "**මේස**" (1972 - සතුට)'**කැලෑ කෙල්ල**' (1987) හා '**ගැලන්ට්**' (1976) - සතුට, සරත් මධු චිත්‍රණය කළ '**යුනිකෝ**' (සිත්තර -1975), '**සෙන්රෝ**' (දසුන)'**නිව්රෝ**' (සතුට-1972) '**ෂාරෝ**' (සත්සිරි (1999), 'ඉනෝමස්' (සදාවාසනා - 1990)'**ස්පාක්**' (සත්සිරි - 1997) හා 2016 දී එළිදැක්වූ සිරිසරුට අඳින '**යුනිකොන්**' ද වේ. සිංහ විසින් ඇඳි '**ටෝගා**' (සිත්තර) හා '**ප්‍රාග්**' (සතුට) කපිල පතිරණ ගේ '**ටොරෝ**', දසුන' (1981), ගුණපාල ජයලත් ඇඳි '**අයස්**' (සත්සිරි) '**වෝ**' (සත්සිරි-2001) ඇන්ටන් බී. පෙරේරාගේ '**අයාමා**' (සිත්තර 1977) අජිත් නිලංග ඇඳි '**ටෙග්ලෝ**' (සත්වරුණ)'**වෙග්රෝ**' සත්මිණ (1987) වික්‍රමශිල්පියා ඇඳි '**වීර තිසියස්**' (සතුට), සුමතිපාල - ජෝතිපාලගේ සිත්තරට ඇඳි '**සෙලීනා**' සිනෙත් බැද්දගේ ඇඳි '**සුලී** ' (හිතවත) බන්ධුල කුමාර සිත්තරට සිතුවම් කළ '**සිකිරි**' ආදී බොහෝ වීර කතා චිත්‍ර කතා පත්තරවල අන්තර්ගත විය.


01 - 05.
කැමිලස්ගේ ගජමෑන් සමඟ
සත්සිරි
1 කාණ්ඩය 5 පත්‍රය 1986 අප්‍රියෙල් 21 වෙනි සඳුදා
පීඩිතයන්ගේ සුසුම, කඳුලු, දහදිය වෙනුවෙන් හේ රුධිරය වැගුරුවේය.
පීඩකයන්ගේ රැවුම, ගෙරවුම මර්දනය වෙනුවෙන් හේ සිය අසිපත එසවීය.
ඒ අසාමාන්‍යයෙකු නොවූ සාමාන්‍ය මිනිසා යළිත්.........
මිල 2.00


රසික
3/=


සත්තාර
ලිච්මන් විරයින් සොයා අතීතයට යයි
2 වන කාණ්ඩය 26 වන

2016 දී ප්‍රකාශයට පත්වූ "**සිරිසරු**" චිත්‍රකතා පුවත්පත දක්වාම වූ සියලුම චිත්‍ර කතා පත්තර වීර කතාවකට හෝ දෙකකට ඉඩ ප්‍රස්ථාව ලබාදුනි. එසේම රෆීක්ඩීන් අඳින ලද '**ශුද්ධ වූරෝමය**', 'ස්කාගස්' වැනි කතාද ඒ අතර වූ '**කුංෆු**' , '**නින්ජා**' වැනි සටන් ක්‍රම මූලික කොටගත් කතා ද '**කව්බෝයි** ' චිත්‍රපට හා බැඳුණු කතා ද ගුවන් හා නාවික කමාන්ඩෝවරු ප්‍රධාන චරිත මැවූ කතා ද '**ජේම්ස්බොන්ඩ්** ' ගණයේ සුපිරි හැකියාවන් සහිත පුද්ගලයන් සිටි කතාද, විවිධ ක්‍රියාන්විතයන් හා සම්බන්ධ කතාද, මුහුදු කොල්ලකරුවන් හා සබැඳි කතා ද, මෙම වීර, ත්‍රාසජනක කතා කලාවේ විවිධ පැති ආවරණය කොට චිත්‍රකතා මගින් ඉදිරිපත් ව තිබේ.

ග්‍රීක වීර කතා ස්වරූපයේ අසහාය වීරයන් සිටි කතා , සමාජ යුක්තිය හා අසාධාරනයට එරෙහිව නැගී ආ පීඩිත පන්තිය නියෝජනය කළ සාමාන්‍ය අය අතරින් නැගී සිටි වීරයන් නියෝජනය කළ කතා හා සටන් කලාවේ පුරෝගාමීන් හා ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ චින්තනය මුල්කොටත් කතා ලෙස ත්‍රාසය මුසුකොට ඉදිරිපත් කළ කතා ලෙස මෙම වීරකතා වර්ග කළ හැකි ය. මේ ආශ්‍රයෙන් අප විසින් ඇසිය යුතු ප්‍රධාන පැනය නම් එවන් කතා පොදු ජනයා අතරේ ජනප්‍රිය වූයේ ඇයි යන්න ය. මෙය අපට විවිධ පැති ඇසුරින් සලකා බැලිය හැක අතර ප්‍රධාන වශයෙන්ම තත් සමාජයේ වූ පීඩනය හා අපේක්ෂා භංගත්වයට පත් උපසංස්කෘතික සමාජ හා ගැමි සමාජ තරුණ කාණ්ඩ විසින් අපේක්ෂා කළ නව වෙනස වෙනුවෙන් පෙනී සිටි වීරවරයා ද මගපෙන්වන්නා ද මෙම අතැම් කතා චරිත තුළ වූ බව උපකල්පනය කළ හැකිය. නව පරිභෝජනවාදී සමාජ නිෂ්පාදන අර්ථ ක්‍රමය තුළ බැට කෑ හා අපේක්ෂා භංගත්වයට පත් තාරුණ්‍යයේ වීරයා 'ස්පාටකස්' වීද? නොමැතිනම් 'බෲස් ලී' චරිත ඔවුනගේ තාරුණ්‍යයේ උදාරතර පරමාර්ථ මුදුන්පත් කළ පරමාදර්ශ වීද? තවදුරටත් සොයා බැලීමේදී අප විසින් මෙකල පවත්වාගෙන ගිය සටන් කලා පංති කොතෙක් දැයි විමසිය යුතුය. කුංෆු, කරාතේ, සටන් කලා පංති සෑම නගරයක ම මෙන් එකල විය. ඇත්තෙන්ම ඒ හා සම්බන්ධ කොට සිතා බැලීමේදී තත් සමාජයේ තාරුණ්‍යය කෙතෙක් දුරට සිය පෞරුෂ වර්ධනය උදෙසා මෙම කලාවන් අධ්‍යයනය කළාද යන්න අපට වටහා ගත හැකි ය. එහි දී චිත්‍ර කතා මගින් ඊට ජීවය සපයමින් නොයෙක් ප්‍රබන්ධ ඊට (සටන් කලාවට) ආසක්ත වුවන් වෙත ගෙන එන ලදී. ඒ අනුව චිත්‍ර කතා අතර වූ වීර කතාංග ඇසුරින් අපට ඒවා අයත් වූ සමාජ වටපිටාව අධ්‍යයනයට අවැසි සාධක සපයන බව පෙනී යයි.

### නිර්මාණාත්මක සංකල්ප සොයා යාම

මෑත කාලයේ වඩාත් ජනප්‍රිය වූ "අවතාර්" වැනි සිනමා පට ද, "හැරීපෝටර්" වැනි අභව්‍ය සිද්ධි රැගත් බටහිර කල්පිත මායා චිත්‍රපටද මගින් ළමා හා තරුණ මෙන්ම වැඩිහිටි මනසේ ගොඩනැංවූ අපූර්ව සිහින එම අද්භූත, මායාකාරී අසාමාන්‍ය ලෝක අපගේ ලාංකේය සිත්තරු විසින් චිත්‍ර කතා ඇසුරින් පරිකල්පනය කළේ මීට දශක කිහිපයකට පෙරාතුවය (සරත්මධු සමග කරන ලද දුරකථන සංවාදය). ඒවා ළමා හා යොවුන් මනැස් තුළ නවමු පරිකල්පන ප්‍රභවය වීමෙහිලා ද හේතු විය. සාමාන්‍ය රසිකයා අතරට වඩා ප්‍රථමව එවන් අද්භූත රස පිරි මනඃකල්පිත ලෝක පිළිබඳ කතා හඳුන්වාදීමත් ඒවා වින්දනය කිරීමට අවස්ථාව ලැබීමත් තුළින් පෙනී යන්නේ එවන් කතාංග ප්‍රිය කළ සමාජ කණ්ඩායමක්ද සිටි බවය.


1975 දෙසැම්බර් මස 15 වන සඳුදා
සිත්තර
ශත 75
පළමුවන කාණ්ඩය නවවන පත්‍රය
පුවත් පතක් ලෙස ශ්‍රී ලංකා ජනරජයේ ලියාපදිංචි කරණ ලදී.


16
1978 ක්වූ පෙබරවාරි මස 6 වන සඳුදා
යුනිකෝ
දෙවන කොටස
EUNICOR
PART TWO
CREATED BY SARATHMADHU

-

-




Sinhala Chitra kata
Ceylon comics on FB
ZENRO




**විලාසිතා හා සමාජ අවශ්‍යතා නිරූපණය**

චිත්‍ර කතා මගින් ඒවා බිහි වූ සමාජයේ විලාසිතා පිළිබඳ ඉතා අගනා සාධක සපයයි. චිත්‍ර කතාවන්හි නිරූපණය වූ චරිත විසින් ඇඳ පැළඳ සිටි ඇඳුම් හා විවිධ විලාසිතා ,හිසකේ - රැවුල් විලාසිතා, යාන-වාහන භාවිතය හා ඒවායේ ජනප්‍රිය විලාසිතා, ගෘහ නිර්මාණ සැලසුම් අංග ආදිය චිත්‍ර කතා ශිල්පීන්ගේ සිතුවම් අතරට එක් විය. එකල වඩා ජනප්‍රිය වූ බටහිර චිත්‍රපට හා හින්දි චිත්‍රපට මගින් මතුව ආ විවිධ විලාසිතාවන් මෙන්ම සිංහල චිත්‍රපට වල ජනප්‍රිය වූ නළු නිලියන්ගේ විලාසිතා ද මේ කෙරෙහි අභාස ලබා තිබේ. විවිධ දුරකථන, වෙනත් සන්නිවේදන උපකරණ, තාක්ෂණික මෙවලම් හා එදිනෙදා භාවිතයට ගත් භාණ්ඩ ආදියත් මෑත කාලයේ ජනප්‍රිය වූ චිත්‍ර කතා අතරට එක් විය.

ජනක රත්නායක, සරත් මධු, ආනන්ද දිසානායක, ඇන්ටන් බී පෙරේරා, අරවින්ද කුමුදු තාරක වැනි චිත්‍රකතා ශිල්පීන්ගේ නිමැවුම් අධ්‍යයනය තුලින් මේ බැව් සනාථ කළ හැකිය. තත් සමාජයේ විවිධ සැරසිලි හා භාණ්ඩ භාවිතයන් ඒ අනුව චිත්‍ර කතා ආශ්‍රයෙන් අපට හමුවේ. එය අපට එම පරිභෝජන රටාවේ ලක්ෂණ විවරණය කිරීමේලා අවැසි සාධක ද සපයයි.




1975 නොවැම්බර් මස 10 වන සඳුදා
සිත්තර
ශත 75
ජීවිතේ ලස්සනම දවස් ගැන කියන කතාව!
පළමුවන කාණ්ඩය
හතරවන පත්‍රය
පුවත් පතක් ලෙස ශ්‍රී ලංකා ජනරජයේ ලියාපදිංචි කරණ ලදී.


සත්වරුණ
6/-




**භාෂා භාවිතය රුචිය හා අවබෝධය**

මෙම සිතුවම්කතා කියවීමේ දී එකල භාෂා භාවිතය අධ්‍යයනය කරන්නෙකුට අවැසි භාෂා භාවිත ක්‍රම හෝ විවිධ වචන භාවිතයට අදාළ තොරතුරු ද හමුවේ. ඒ අනුව කිසියම් ආකාරයකට මෙම මාධ්‍ය හැසිරවූ පිරිස් හා කතා රචකයන් මෙන්ම ඒවා ඇසුරු කළ ජන සංස්කෘතික කණ්ඩායම් අතර වූ භාෂාවේ විවිධතා වේ නම් ඒවා ද මෙම චිත්‍රකතා පුවත් තුළ වූ ලිඛිත වාක්‍ය ඛණ්ඩ අතර ගැබ්විය. එක්තරා අයුරකින් එය එම සමාජයේම භාෂා භාවිතයේ ස්වරූප පිළිබඳ සිතාබැලීමට අපට දොරටු විවර කරයි.

චිත්‍ර කතාවලට එක් කළ නොයෙක් තේමාවලට යෙදූ නාම (කතාවේ නම) එකට ගෙන ගොනු කළ හොත් ඒ ඇසුරින් ද සමාජය ප්‍රිය කළ හා අවධාරණය කරනු ලැබූ ඉලක්ක සම්බන්ධයෙන් අදහසක් අපට ලබාගත හැකි වේ. දයා රාජපක්ෂ විසින් රචනා කොට චිත්‍රයට නැගූ බොහෝ කතා මගින් සමාජයේ විවිධ උපසංස්කෘති අර්බුද හා එම ජීවන රටාව පිළිබඳ ප්‍රශ්න කළ අවස්ථා වේ. ඔහු වඩාත් විචාරශීලී ව ඒ පිළිබඳ සිය තේමාවන් චිත්‍ර කතා මගින් ඉදිරිපත් කළ බවට විචාරක මත වේ (ආරියරත්න 2007- 64, 65 පිටු). බන්දුල හරිශ්චන්ද්‍ර සිය කතා තේමා සාහිත්‍ය දැනුම් පෝෂණයෙන් සන්නද්ධ කොටගත් අවස්ථා අපට හමුවේ. එදා මෙදාතුර බිහිවූ චිත්‍ර කතා පුවත් විසින් පාඨකයා වෙත ඉදිරිපත් කළ කතා සියල්ල ම ගෙන ඒ සම්බන්ධයෙන් ගැඹුරු විග්‍රහයක් කිරීම මගින් මීට අදාළව අපට ගුණාත්මක පර්යේෂණයක් කිරීමේ හැකියාව ඇත.

චිත්‍ර කතා රචකයන් සිය කතාවේ තේමාව විශේෂ ආකර්ෂණ ලක්කරනු වස් එය විශේෂ පාඨයකින් හඳුන්වනු ලැබූ අවස්ථා වේ. කතාවේ අන්තර්ගතය හකුළුවා ලියූ විශේෂ චිත්‍ර කතා 'පාඨ' මෙන්ම නිසඳැස් ස්වරූපයේ වචන ඛණ්ඩ හා ආකර්ශණීය හැඳින්වීම් භාවිත කළ අවස්ථා වේ. මේවා අධ්‍යයනය මගින් අපට පෙනී යන්නේ විවිධ ආකර්ශනීය කතා රචනා ශෛලීන් ප්‍රිය කළ හා එම ක්‍රම පිළිබඳ මනා අවබෝධයක් සහිත පාඨක සමාජයක් ද වූ බවයි. එහෙයින් චිත්‍ර කතා කියවූ පිරිස්

අතරට චිත්‍ර රසය ඉක්ම වූ සාහිත්‍ය රස වින්දන හැකියා ප්‍රදර්ශනය කළ පිරිසක් ද වූ බව පැහැදිලි ය. විවිධ චිත්‍ර කතා තුළ අන්තර්ගත වූ භාෂා භාවිතය පිළිබඳ හඳුනාගැනීම සඳහා පහත උදාහරණ කිහිපය ඉදිරිපත් කළ හැකි ය.

**"අහසයි පොළවයි යාවේදෝ යම් දිනක**
**යාවෙතැයි යන හැඟුම පමණයි**
**මෙතෙක් කල් මා සිතා සිටියේ !**
**දෑස වසාගෙන මනැසින් බැලුවද**
**ඔබයි මමයි හැර...**
**තෙවැන්නකු නැත**
**මෙමා දුටුවේ."**

(සරත් මධුගේ විසින් ඇඳි 'කෙල්ලො" චිත්‍ර කතාවෙනි)




**"ජීවිතයේ ලස්සන ම දවස් ගැන කියන කතාව"**
('ඉතිං ඊට පස්සේ' චිත්‍ර කතාව - සරත් මධු - සිත්තර-1975)

**"සමන් පිච්ච මලක් වගේ සුමුදු පිරිසිදු නැවුම් ලස්සන සුජානිගේ කතාව"**
('ඉස්සරට වඩා' චිත්‍ර කතාව - සරත් මධු - සිතුවම -1978)




**"සෙව්වන්දි කියන්නේ රෝසමල් බව මා දැනගෙන සිටියා**
**ඒත් එහි කටු අග විසකටු ඇති බව මට ඩිංගකට අමතක වුණා."**
(ආනන්ද දිසානායක සුහද චිත්‍ර කතා පත්තරටයට ඇඳි 'සෙව්වන්දි' චිත්‍ර කතාව)

**"සෙනෙහසේ දයාවෙන් සදාදර බව මා ලන් කළ අපේ ආදර කතාව"**
('TIKEE - MY LOVE -  සුමුදු 'සිව්රසට' ඇඳි චිත්‍ර කතාව 1998)




**"මොහොතක සුවය සොයා ගොස් අඳුරු අගාධයකට වැටුණ තරුණ ජීවිත කිහිපයක්"**

('මත් බමරු' ප්‍රියානන්ද විජේසුන්දර සහ සිරිපාල කත්‍රිආරච්චි , 'සත්මිණ' -1988)

**"සෙනෙහසෙහි මුලකුර කියාදුන් ඔහු ම මගේ සොඳුරු පෙම්ගීය පළුදු කළ කල මා සකල මිනිස් සංහතිය කෙරෙහි රොද බැඳ ගත්තා ...... කවර වරද ද?"**

('සත්‍යදේවි' නම් සතුට පුවතට දයා රාජපක්ෂ ලියා ඇඳි කතාව - 1990)




**"ඔයාලා අපි නොදන්නා තවත් අපූරු ලෝකයක්... ! හිරු නොදුටු පිනිබර මලක් වගේ පුංචි ලස්සන සුරංගනාවියක්.... එයාගේ නම අලෝහා ! එත් එයා ජීවත් වූයේ ඔයාලා අපි ජීවත්වන ලෝකෙක නොවෙයි. ඒට හාත්පසින් ම වෙනස් දියුණු අමුතු ම ලෝකයක ඒ තමයි... ආදරයක් නැති ලොවක් "**

කුමාර චිත්‍ර ශිල්පියා 'ආදරයක් නැති ලොවට'ප්‍රවේශ වන්නේ එලෙසයි.

ඇන්ටන් තානාපති සිය "මකර දේවාලය" චිත්‍ර කතාවට මෙලෙස පාඨයක් එක් කරයි.

**"වේගය අභිබවා යුක්තියට එසවෙන අයෝමය හස්තය"**

**"දරු දුක දන්නා අම්මාවරුන්ගේ ලය පුපුරා ඇසුණු විලාපය"**

('කිරි සුවඳක් හමාගියා ' කතාව- අනෝමා ගංගොඩ, චිත්‍ර - ගාමිණී අබේකෝන්)

**"ලෝකයේ මෙතෙක් විසූ ලස්නන ම කුමරිය සහ ශක්තිමත්ම සටන්කාමී අයෝමය පුරුෂයා පිළිබඳ කතාව"-**

('සන්රෝ' සරත් මධු - සිතුවම පුවත්පත)

රෆීක් ඩීන්ගේ චිත්‍ර කතාවල කතා රචකයන් අපූරු ලෙස භාෂාව භාවිත කරනු දැකගත හැකිය.

**" උඹත් වෙයන් ස්පාටකස් කෙනෙක්...**
**ඒත් එපා ... මැරෙන්න ඒ වගේ"**
('ස්කාගස්' චිත්‍ර කතාව)




ඔහුගේ ක්ලැඩියේටර් චිත්‍ර කතාංගයක පහත දැක්වෙන වැකිද ඊට සමාන ය.

**"කාටවත් නොපෙනී එම ස්ථානයට පැමිණියා ඔහු"**
**"තිබුණා තව පඩි පෙළක් උමගේ පහළට යන්නට"**

මේ ආකාරයේ චිත්‍රකතාවල දෙබස් හා වදන් යෙදුම් ඇසුරින් එදා සමාජයේ භාෂා භාවිතය මෙන්ම විවිධ වෙනස්කම් ද අපට නිරීක්‍ෂණය කළ හැකි වේ. එසේ ම දෘශ්‍ය අක්‍ෂර ප්‍රබලව භාවිත වන චිත්‍ර කතාවේ වචනාර්ථ ප්‍රකාශන ද කිසියම් වෙනස් අයුරකින් යොදා ගැනීම තුලින් පෙනී යන්නේ පාඨක ජනයාද ඊට දැක්වූ කැමත්ත හා අවබෝධයයි. චිත්‍රකතා රස විඳි සමාජයේ සිතුම් පැතුම් විමර්ශනයෙහි ලා මෙමගින් යම් ආකාරයක හෝඩුවාවක් අපට ලැබේ. එසේ ම සමකාලීන සාහිත්‍ය ධාරාවන්ගේ බලපෑම ද ක්‍රමයෙන් චිත්‍ර කතා රචනා අතරට එක්වූ අයුරු ද මේ අයුරින් හඳුනාගැනීමට පිළිවන.


අර ඈත අහසේ හිනාවෙන පුංචි තරුවට කියන්නද ....
නුඹ මාත් එක්කලා තරහා වෙලා කියලා ..........
පුංචිම පුංචි සේපාලිකාවට කියන්නද
නුඹ මාව අඬවනවා කියලා ..........
අනේ ........ එයාලාට දුක හිතෙයි ..........
නුඹට දෙස් කියයි ........
මං කාත් එක්කවත් කියන්නෑ ......
ඉතිං කියන්න
ඔයා මට ආදරෙයි
නේද ......?
සෙනෙහසේ දයාවෙන්
සඳදර ඔබ මා ලංකොට
අපේ ආදර
කතාව.....
TIKEE
MY LOVE
දිගහැර යෞවනයේ චමත්කාරය එක්කළ, තවත් අලුත් ආදර කතාවක් .....
රූ රටා :- සුමුදු


SIKARI






චිත්‍ර කතා ශිල්පීන් විසින් සිය නම භාවිත කිරීමේ දී එය ලියා දැක්වූ විවිධ ආකාර වේ. එසේ ම සිය කතාවේ නාමය ද ඉතා කදිමට සැලසුම් කළ අයුරු ද විශේෂ ය. මේ කෙරෙහි ද අපගේ අවධානය යොමුවීම වටී. ඔවුන් විසින් ඇඳි දහසක් චිත්‍ර කතා හා ඔවුනගේ අත්සන් (නම යෙදූ අයුරු) ගෙන බැලුවහොත් ඒවා තුළ වූ විවිධ ශෛලීන් රටා හා සංරචන ක්‍රම අතිශය මනහර ය. ඒවා සිංහල අක්ෂරවල විවිධ හැඩ රටා හා ශෛලීන් බිහි කිරීමෙහිලා ද පාදක විය.

**සමාලෝචනය**

අප විසින් මෙතෙක් සලකා බැලූ කරුණු ඇසුරින් පෙන්වා දිය හැක්කේ ප්‍රබල සංනිවේදන මාධ්‍යයක් ලෙස චිත්‍ර කතා පුවත්පත් ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ වැදගත් කාර්යයක් සිදු කොට ඇති බව ය. එසේම ශාස්ත්‍රීය මට්ටමේ ඇගයීමක් එහිලා කිරීමේ ඇති හාකියාවද ඇති බවය. එසේ ම නූතන තාක්ෂණය විසින් හඳුන්වා දී ඇති නව සන්නිවේදන ක්‍රම තුළ පවා එය යම් රසික අවධානයක පසුවන බවය. ඒ අනුව ඉතා ගැඹුරින් මෙම චිත්‍ර කලා පුවත්පත් කලාව නොමැතිනම් මෙම සාහිත්‍ය අංගය විභාග කරන්නෙකුට එය කෙතෙක් දුරට තත් සමාජ ව්‍යුහයන් හා බද්ධ වී ඇති ද යන්න මෙන්ම ඒ මගින් එය හැසිරවූ හා එය ස්පර්ශ කළ සමාජයේ සිතුම් පැතුම් පිළිබඳ ව කවර ප්‍රතිබිම්බයක් ඉදිරිපත් කරයි ද යන්න හඳුනා ගැනීම අසීරු නොවේ.

තවද මෙම සාහිත්‍යාංගය ශ්‍රී ලාංකේය සාහිත්‍ය පෝෂණය උදෙසා තවදුරටත් සක්‍රීය කිරීමේ හැකියාව පවතින අතර එමගින් එය පරිභෝජනය කරනු ලබන සංස්කෘතික ධාරාවන්ගේ නිර්මාණාත්මක සංකල්ප පොහොසත් කිරීමෙහිලා එය භාවිත කළ හැකි වේ. දෘශ්‍යාක්ෂර ඇසුරින් පොහොසත් වූ මෙම මාධ්‍ය ඇසුරින් නිර්මාණාත්මක හා බුද්ධිමත් ජන සමාජයක් ගොඩනැගංවීමේ ලා අවැසි සහය ද ලබා ගැනීමේ අවකාශය තවදුරටත් පවතී.

## ආශ්‍රිත මූලාශ්‍රය


ආරියරත්න, සුනිල්, (2007), *චිත්‍ර කතාවේ වංශ කතාව*, කොළඹ.

වර්ණසූරිය, නිසිත, (1993), *චිත්‍ර කතාවේ සමාජ මුහුණුවර*, කොළඹ.

Gaurav, Puri ,(2009), *Reading History in Comics, Dissertation Report* - MIC, Ahmedabad.

History of American Comics - Wikipedia, the Free encyclopedia.

කපිල, ක්‍රිශාන්ත (2016), *වැඩිහිටියන්ගේ හණමිටි අදහස් හා සරත් මධුලාගේ සුන්දර ලෝකය*. මව්බිම, 2016 අප්‍රේල් 10 ඉරිදා. 12-13 පිටු.

SINHALACHITRAKATA CEYLON COMICS , face book page.

සරත්මධු සමග කරන ලද දුරකථන සංවාදය -2016 මාර්තු